ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/S/22/02/23

# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනී විනිසුරු රෝහිණී මාරසිංහ මැතිණියගේ මූලිකත්වයෙන් කොමිෂන් සභාවේ කොමසාරිස් අනුසුයා ෂන්මුගනාදන් මැතිණිය සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කණ්ඩායමක් උතුරු පළාතේ මානව හිමිකම් තත්වය පරීක්ෂා කිරීමේ චාරිකාවක් 2023 පෙබරවාරි මස 16, 17 සහ 18 යන දිනවල යාපනය සහ මන්නාරම නගර කේන්ද්‍රකර ගෙන සිදුකරන ලදී.

මෙම සංචාරයේ දී මූලිකව අංශ 03 ක් කෙරෙහි අවධානය යොමුකරන ලදී.

1. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් සඳහා ස්වේච්ඡා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඇති කිරීම.
2. මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම්, මුහුදු මාර්ගයෙන් සිදුවන ජාවාරම් කිරීම් සහ උතුරු පළාතේ පොලීසිය සහ යුධ හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන මාර්ග පරීක්ෂා කිරීමේ ස්ථාන සහ ඇති කර ඇති මාර්ග බාධක සම්බන්ධයෙන් විමසා බැලීම.
3. සත්‍ය සහ සංහිඳියාව පිළිබඳ කොමිෂන් සභාවක් ඇති කිරීම, දීර්ඝකාලීනව රැඳවියන් සහ අතුරුදහන් වූවන් පිළිබඳ විමසා බැලීමත් ය.

මෙම සංචාරයේ දී කොමිෂන් සභාව පොලිස් නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, ආගමික නායකයින්, උතුරු පළාතේ දේශපාලන පක්ෂ නියෝජිතයින්, සිවිල් සංවිධාන නියෝජිතයින්, අතුරුදහන් වූ සහ දීර්ඝ කාලීන රැඳවියන්ගේ නියෝජිතයින් සහ එම පවුල් වල සාමාජිකයින් මුණගැසීම සිදුකරන ලදී.

මෙහිදී උක්ත පාර්ශව විසින් ඉදිරිපත් වූ කරුණු සහ ගැටළු පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් වාර්තාවක් අතිගරු ජනාධිපතිතුමා වෙත 2023 පෙබරවාරි මස 22 වන දින බාරදෙන ලදී.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.02.22